කෙටි කතාව

ගිමන් හරින්නා සහ අශ්ව හිස

මෙය වන්දනාකරුවන්ට මහත් ආශ්වාදයක් වූ බව ඔහුට හැඟි ගියෙන් ඔහු එය ආශ්වාදයක් කොට ගත්තේය. වරුවක් පමණ එකම ඉරියව්වෙන් සිටීමට තරම් වන සංයමයක් සහ උත්තේජනයක් රා පානය විසින් සපයන ලැබ තිබිණ. ඒ වරුව ඇතුළත බොහෝ පිරිස් මෙම අද්භූත සත්වයාගේ ගැඹුරු සමාධිය ඉසුරුමුණියේ අන් සියලු දෑ දැක බලා ගන්නා විශ්මයෙන් ම දැක බලා ගත් අතර කිසිවෙකුත් ඔහුගේ ධ්‍යානයට ගල් පෙරලුයේ නැත.

ගිමන් හරින්නා හැමදාම සිටියේත් සිටින්නේත් එතැනම ය. බුදු කුටියට පිවිසෙන ද්වාරයට කුණු පස ගල් කුල මත ය. වැසි දිය ඔහු මත පතිත නොවනු පිණිස කටාරම් කොටා තිබිණ.

බුදුකුටියේ පිවිසුම් ද්වාරයට යා වූ කළු ගල් බැම්මෙහි ජනෙල් විවරයකි. එහි සිහින් කෙටිගල් බැම් දෙකක් අතරින් මතු වූ මල හැලෙන කටු කම්බි රෝල අපිළිවෙල කෙහෙ වල්ලන් සේ එළියට ඇදහැලෙමින් ගිමන් හරින්නාගේ මුනිවර මුහුණුවර වසාගෙන තිබිණ. කම්බි දෙපොටක් අතරේ වියා තිබූ කෙළු දැල අස්සෙන් අශ්වයාගේ තීක්ෂණ දෑස වෙනදා සේ ම දැල්වෙමින් තිබිණ. ගිමන් හරින්නාගේත් අශ්වයා-ගේත් සදාතනික ලෙංගතුකම අතීසය උකටලීව සිටී ඔහු උක්කුටිකව වාඩි විය.

ඇත මඟුල් පොකුණ දෙස උපේක්ෂාවෙන් බලා සිටි ගිමන් හරින්නා මදක් හිස පහත්කොට ඔහු-ගේ නුපුරුදු සෙයියාව දෙස බලා මදහසක් නැගීය. වෙනදාට තමන් සේ ම සැහැල්ලුව ගල්තලාව මත ඉඳගන්නා ඔහු නැමුණු දණහිස මත සැහැල්ලුව අත තබා සිටිනා නමුත් අද උක්කුටික වූයේ ඇයිදැයි සිතන්නට විය. ඔහුගේ සිත ලජ්ජාවෙන් ඇලලූණි. පිළිවදන් මදහස පෑ ඔහු ගිමන් හරින්නාගේ දෑසින් මිදී ගල්පඩි ගනිමින් ඉසුරුමුණි සෑය අසබඩ ගල්තලාවේ මුණින්තලා විය.

තිසා වැව දිය සිප හමන්නේ සීතල පවනැල්ල නොව අතීත සිතිවිලි බව සක්සුදක් සේ පැහැදිලි විය. කල්ප කාලයක් ඉපැරණි සිතිවිලි වලින් ඔහුගේ සිත ව්‍යාකූල වී ගියේ ය.

ගිමන් හරින්නා වෙනෙකෙකු නොව තමා ම බව ඔහුට පසක් වෙමින් තිබිණ.

2

සෙල්ලම ඇරඹුණේ රා මතත් සමඟිනි. හැමදාම සේ ම එදත් නිවන්න ජේතිය විදහලේ කන්සිනාව අතරින් රිංගාගත් මිතුරෝ ඉසුරුමුණිය දෙසට පිය නැඟූහ. විහාර භූමියක් වුව ඉසුරුමුණිය යන්න ඔහුගේ සිතේ සංකේත ගත වී තිබුණේ "ප්‍රේමයේ නිදහස් පාරාදීසයක්" ලෙසිනි. ප්‍රේමය පිළිබඳ බරපතල ආකල්ප හෝ හැඟීම් නොතිබූ බැවින් මිත්‍ර සන්ධානය තුළ සංතර්පණය වීම ම ජීවිතය කර ගත් ඔහු "ප්‍රේමයේ නිදහස් පාරාදීසය" යන සංකේතයේ වූ 'ප්‍රේමය' ලොප් කොට නිදහස් පාරාදීසයක් ය යන්න තුළ ඉසුරුමුණිය සංකේත ගත කළේය.

එවක ඉසුරුමුණියේ පෙරවරු සමයේ සිටියේ ප්‍රවේශපත්‍රකරුවාත්, කෞතුකාගාර භාරකරුත්, ඉසුරුමුණියේ අයිතිකාරයා ලෙස සිතා සිටි එහි මුරකරු තේගිසුත් පමණි.

තිසා වැ කණ්ඩිය දිගේ ගොස් කැලෑ පාරෙන් වෙහෙර මළුවට ප්‍රවේශ වන බැවින් ඔහු ඇතුළු මිතුරන්ට කිසිදාක ප්‍රවේශපත්‍ර ඇවැසි නොවුණි.

සරම ඇඳ රෙදි බැනියම ඊට යටකොට පළල් ඉඟ පටියක් බැඳ සිටින තේගිස් බැනියමට උඩින් බොත්තම් නොලැ තාකි කමිසය එල්ලාගෙන සිටියේය. සුදු සන උඩු රැවුල මදක් උඩට කැරකී තිබුණ අතර කම්මුල් දිළිසෙන තරමට ම යටි රැවුල මත දැලිපිහිය තබා තිබුණි. තේගිස්ට තිබුණේ වසවර්ති දෑසකි. ඒත් ඒ දෑසට යටින් සිටියේ අහිංසකයෙකු බව තේරුම් ගැනීමට ඔහුට වැඩි කලක් ගතවූයේ නැත .

පාසලෙන් කටටි පනින මිතුරන් සියල්ලන් ම හැමදාම ඉසුරුමුණියට පිවිසෙන්නේ චූවින්ගම හපමිනි. ගල් කුළ බඳට ගොඩවන මිතුරෝ දිගු ලී කෝටු ගෙන එහි අග්ගිසි මත චූවින්ගම අලවති. අනතුරුව පිවිසෙන්නේ ගිමන් හරින්නා සිටින ඉසව්වටයි. එතැන ඉදිකර ඇති යකඩ වැටට බර වී, ඇත් පෙළ පාමුල විසිරි තිබෙන පඬුරු වෙතට ලී කෝටු යැවෙයි. ලී කෝටු අග්ගිසි වල පැටලී ඒවා එකින් එක උඩට මතු වේවි. ලුණු මිරිස් හා මයියොක්කා කටගැස්ම සමතෙකි. ඔහු ද කවියේ බුහුටිකම පෑ ය.

ඉන් අනතුරුව වන්දනා කොලු නඩය රා සප්පායම වූ යේ ඉසුරුමුණියට අතේ දුරින් සිසා වැව රක්ෂිතය තුළ ම වූ තේගිස්ගේ ආරක්ෂක නිල නිවසෙහි ය.

කෙසේ හෝ ඔහුගේ මේ සෙල්ලම ඇරඹුණේ රා මතත් සමඟිනි.

පඬුරු එක්කාසු කර ගැනීමෙන් අනතුරුව ඉසුරුමුණියෙන් අතුරුදහන් වන මිතුයෝ යළි එදින කිසිවිටෙකත් වෙහෙර භූමියට නොවන මුත් එදා රා මතින් ඔහුගේ කව් සිත හොඳටෝම අවදිවී තිබිණි. තේගිස්ගේ නිවසින් එළියට බට ඔහු වැ කණ්ඩියට නැග මොහොතක් සරැලි නගින දිය කඳ දෙස බලා සිටියේ ය. සුපුරුදු හොර පාරෙන් ඉසුරුමුණියට වැදුණු ඔහු ගිමන් හරින්නා අතීසය ගල් තලාව මත ගිමන් හරින්නාගේ නිදහස් සෙයියාවෙන් ඉඳ ගත්තේය. ගිමන් හරින්නා දෙසත් අග්වයාගේ දෑස දෙසත් ඔහේ බලා ගෙන උන්නේය. එය සෙල්ලමක් බවට පත් වූයේ එවිට ය.

ඉසුරුමුණිය වන්දනාවේ ආ සැබෑ වන්දනාකරුවෝ බුදු කුටියට පිවිසෙන විට අමුතු සෙයියාවෙන් වාඩි වී කල්පනාවේ නිමග්නව සිටින මේ අමුතු පාසල් සිසුවා දුටහ. ඔහු අසලට පිවිසි කල ඔවුනට දක්නට ලැබුණේ ඔහු ඉදිරියේ මෙම අපූර්ව සෙයියාවෙන් ම සිටිනා ගිමන් හරින්නා ය. මෙය වන්දනාකරුවන්ට මහත් ආශ්වාදයක් වූ බව ඔහුට හැඟී ගියෙන් ඔහු එය ආශ්වාදයක් කොට ගත්තේය. වරුවක් පමණ එකම ඉරියව්වෙන් සිටීමට තරම් වන සංයමයක් සහ උත්තේජනයක් රා පානය විසින් සපයන ලැබ තිබිණ. ඒ වරුව ඇතුළත බොහෝ පිරිස් මෙම අද්භූත සත්වයාගේ ගැඹුරු සමාධිය ඉසුරුමුණියේ අන් සියලු දෑ දැක බලා ගන්නා විශ්මයෙන් ම දැක බලා ගත් අතර කිසිවෙකුත් ඔහුගේ ධ්‍යානයට ගල් පෙරලුයේ නැත .

3

නීලාට තිබුණේ මලානික දෑසකි. ඇ සුදු වුවත් මුහුණේ ලේ කඳුලක් වත් පෙනෙන්නට නැතැයි ඔහුට සිතුණු වාර අනන්තය. අගිස්සෙන් පහතට නැමී ඇති ඇගේ දිගු නාසය තුළින් යම් ප්‍රොඩ පෙනුමක් ඇට ආරෝපණය කරලීමට ඔහු යත්න දැරීය. විටෙක ඔහු කිසිදාක තෝඩු නොලැ ඇගේ දිගු දෙසවනට තාරකා දෙකක් පළන්දා සිතින් හැඩ බැලීය. විටෙක ඔහු කන් පෙති අතගා බැලී ය. හදවතේ හුරතලේ තුළ ඔහු ඇතැම්විට කන් මිරිකීය. එවිට මුහුණ රතු වී තාරකාලෝකය ඒ මත පතිත විය. ඕනෑවට එපාවට මෙන් කරලකට ගොතා තිබූ ඇගේ දිගු කෙහෙරැල්ලෙන් මඟන මුදු පොල්තෙල් ගඳ පහව යන්නට තිසා වැවෙන් ඇය හෆාවා සුවඳ කැවු හැඟිලි තෙලින් කෙස්ස තවරා, එය පීරා කරල් දෙකකට ගෙතී නම් ඇගේ පෙනුම කෙතරම් දගකාර දැයි ඔහු සිතීය.

ඔහුගේ ප්‍රේමයේ පහස දැනී නීලාගේ මලානික දෑස මහනෙල් පෙති දෙකක් සේ විකසිත වූ දිනයේ ඇ හා මුහුණට මුහුණ හමුවීමට ඔහුට කිසිවිටෙකත් අවස්ථාවක් උදා නොවුණි. ඇගේ මේ ලෙංගතුකම කිසිවිටෙකත් මෙතරම් සමීප වෙතැයි හිතීමට කිසිදා සාක්ෂියක් නැති.

"ඔයා මාව දන්නවද" ඔහු එම ප්‍රශ්නය ඇසුයේ එබැවිනි. .

"කවුද ඔයාව නොදන්නේ. අපේ ඉස්කෝලේ කෙල්ලො ඔක්කොම දන්නවා. ඔයා හරි ප්‍රසිද්ධයි"

ඇගේ දෑස නිල් පෑ වෙමින් ද දෙකොපුල් රත් පෑ වෙමින් ද තිබෙන බව ඔහු දුටු යේ හිස ඔසවා ඇ දෙස සාපුව බැලීම නිසා ය. ඒ ඔහු ඇ දෙස බැලූ ප්‍රථම සාපු බැල්ම විය.

"මම කවුද "ඔහු තීරණාත්මකව ඇසීය.

"ගිමන් හරින්නා" සිනා නගා ගත් වන ම මිදුලට පැන ගත් ඇ වැ කණ්ඩිය මතින් දිව යනු ඔහු නිසොල්මන්ව බලා සිටියේ ය.

4

ඔහු සිටියේ රා වඩිය වැඩි වීම කරණ කොට ගෙන තේගිස්ගේ ලණු ඇඳේ පතබැව් ගෙන ය. මිතුරෝ ද තේගිස් ද එවෙලේ තිසා වැවේ දියබෑං ගසමින් කෙළිදෙලෙන් පසු වූහ. ඇය ඉස්කෝල ඇරී ගෙදර එන විට ගෙයි සිටියේ ඔහු පමණි.

ඇය සපත්තු මෙස් ගලවා ගවුමෙන් දිය රෙද්දට මාරු වී තුවාය ද ගෙලේ එල්ලාගෙන සබන් පෙට්ටිය සෙවූ නමුත් එය කොහේවත් නොවුණි. තාත්තාගේ කුටියට ඇ එබුණේ සබන් පෙට්ටිය සොයනු පිණිස ය.

මළකඳක් සේ ලණු ඇඳ මත පත බෑ වී සිටින කඩවසම් කොල්ලා දැක ඇ මවිත වූ වා ය.

එවිට ම කල්ප කාලයක් ඉපැරණි සිතිවිලි සිතෙහි කැලැත්තී ඔහුගේ ඇස ඇරුණි. ඇ දැකීමෙන් ලජ්ජාවට පත් වූ ඔහුට සැනින් ලණු ඇඳේ ඉඳ ගැනුණි.

"කෝ තාත්තා"ඔහු හිස නොඔසවා ම ඇසී ය.

"මං අහන්න ඕනා ප්‍රශ්නේ ඔයා ඇහුවේ" ඇගේ කටකාර කටහඬ ඔහුගේ සිතට ප්‍රාණය පුරවමින් තිබුණි. "තාත්තා හිටියේ ඔයාලත් එක්ක"

"මට නින්ද ගියා" ඔහු අසරණව පැවසී ය.

"මං දැක්කා නිදාගෙන හිටපු උජාරුව" ඇය ගණනකට නොගෙන ම පැවසුවා ය. "හරිනම් කියන්න ඕන නින්ද ගියා කියලා නෙමේ. මට ටිකක් වැඩි වුනා කියලා" ඇය නොහෙබිනා සිරික්කියකින් පැවසුවා ය.

"තව ටිකක් නිදා ගන්න " මං නාගෙන ඇවිත් බත් බෙදලා දෙන්නම්.

බොහෝ විට තමා හොරෙන් ඇ දෙස බලා සිටිය ද කිසිදාක ඇය මෙතරම් ලෙංගතුකමින් තමා හඳුනතියි සිතා නොසිටි ඔහු ගේ හිත නොසෑහෙන්න කැළඹිණි. ඔහු ඇතුළු මිතුරන්ට රා බීමේ අවසරය ලබා දුන් තේගිස් ඔවුන්ට පැන වූ එක ම කොන්දේසිය වූ යේ දියණිය ඉස්කෝලේ ඇරී පැමිණීමට පෙර පිටව යා යුතු බව යි. ඒ සාධාරණ කොන්දේසියට ගරු කළෙන් කිසිවිටෙකත් ඔවුහු පාසල් ඇරෙන වෙලාව තෙක් තේගිස් නිවසේ ගත නොකළහ. එබැවින් රා නොබී දිනවල ද ඔහුට ඉසුරුමුණියට යාමට හේතුවක් නිර්මාණය වී තිබුණි. නීලා ය.

ඒ වන විට කැලෑ පාර කම්බි වැටකින් අවුරා තිබුණෙන් ඉසුරුමුණියට ප්‍රවේශ විය යුතුව තිබුණේ ප්‍රවේශ ගේට්ටුව හරහා ය.

හැමදාම ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම පාසල් සිසුවකු වූ ඔහුට බර වැඩි විය. එහෙයින් ම සමාධි සෙල්ලම තවත් පියවරකින් ඉදිරියට ගැනීමට ඔහුට සිදු විය. ඔහුට ඊට අවස්ථාව උදා කළේ ද ප්‍රවේශපත්‍ර විකුණන්නා ම ය.

" මොකක්ද ඔයාට ඔය තරමට ගිමන් හරින්නා එක්ක

මංජුල වේඩිවර්ධන

තියෙන සම්බන්ධය" දිනක් ප්‍රවේශපත්‍ර විකුණන්නා ඔහුගෙන් ඇසීය.

ඔහු හැඟුමින් ආඩ්‍යව මොහොතක් ගත කළේය. "ඒක දිග කතාවක්. " ඔහු වචන තුළ ද හැඟුම් තවරා ගැනීමට වෙර වැඩිය. "මට හිතෙන්නේ ඒ මං කියලා. සංසාරගත බැඳීමක්. ඒ මගේ අස්සයා. මාත් එක්ක හැම තැනම ගියේ උෆ. මං තනිවුනා අස්සයත් එක්ක. හැමදේම නැතිවුනා" ඔහු හිතාමතා ම දීඝ සුසුමක් පිට කර හැරියේය.

ප්‍රවේශපත් විකුණන්නා හිස ගසා මවිතය පළ කරමින් සූරතේ ඇඟිලි තුඩු වලින් නළල කිතිකවා ගත්තේ ය.

"පුනරුත්පත්තියක් ද ? " යි අසන විට ප්‍රවේශපත් විකුණන්නාගේ තොල කට වියලී තිබුණි.

"දන්නෑ. වෙන්න ඇති " ඔහුගේ වචන ඇසෙන නැසෙන තරම් සංවේගජනක විය.

"කොහොමත් මට දැනෙනවා මෙතන මගේ ම විත්තිය. මේ හැම දෙයක් ම, හැම ගල් පොත්තක් ම මං අඳුනනවා. මේ හැම නෙළමක් ම. මානෙල්

36 වන පිටුවට